ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement

**2026.02.05** **චක්‍රලේඛ අංක : 06/2026**

**සියලුම දිසා කොමසාරිස්වරුන් හා සහාය දිසා කොමසාරිස් (පුහුණු) වෙත,**

**බාලදක්ෂ නායක – ලී පදක්කම් පුහුණුව**

**154 වන IV අදියර බාලදක්ෂ නායක උසස් පාඨමාලාව**
**2026 මාර්තු මස 14 - 20 දක්වා**
**පීඩෲ බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානයේ දී**

**2025.11.25 වන දින අප විසින් යොමු කරන ලද චක්‍රලේඛ අංක : 69 /2025 හා බැඳේ.**

**2025 දෙසැම්බර් මස 17 සිට 23 දක්වා පීඩෲ බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානයේ දී පුහුණුකිරීමේ නායක ඒ.ජී.සී.ජී. අලගල්ල මහතාගේ** අධ්‍යක්ෂණය යටතේ පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබු ඉහත පාඨමාලාව එම කාලයේදී රටෙහි පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් පැවැත්වීමට නොහැකි විය.

එබැවින් කල් දැමූ මෙම පාඨමාලාව 2026 මාර්තු මස 14 - 20 යන දිනවල පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. එම පාඨමාලාව සඳහා තවත් සීමිත පිරිසකට අවස්ථාව ලබා දීමට හැකි බැවින් මේ සඳහා සුදුසු අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණය 2026.02.21 වන සෙනසුරාදා දින පෙ.ව 9.00 ට පැවැත්වේ.

චක්‍රලේඛ අංක 69 /2025 හි සඳහන් පරිදි සියලු සුදුසුකම් සපුරාලිය යුතු අතර පාඨමාලාව ආරම්භ කරන දිනය වන 2026 මාර්තු 14 වන දිනට දෙවන අදියර සම්පූර්ණ කර මාස 06 ක් සම්පූර්ණ කර තිබිය යුතුය.

මේ සමග අමුණා ඇති අයදුම් පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර, **2026 පෙබරවාරි මස 14 වන දිනට ප්‍රථම** ජාතික බාලදක්ෂ මූලස්ථානයේ පුහුණුකිරීමේ අංශයට යොමු කරවීමට කටයුතු කරන්න.

පාඨමාලා ගාස්තුව : රු. 6,000/- කි.

සම්මුඛ පරීක්ෂණයට සම්පූර්ණ බාලදක්ෂ නිළ ඇඳුමින් පැමිණිය යුතුය.

ස්තුතියි.

මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

**කර්නල් පද්මලාල් පෙරේරා**
**ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්**

**නිතීඥ මනෝජ නානායක්කාර**
**ප්‍රධාන කොමසාරිස්**

පිටපත් : මූලස්ථානයේ සියලුම කොමසාරිස්වරුන්
සභාපති /විධායක කමිටු සභාපති/ගරු ලේකම් /ගරු භාණ්ඩාගාරික ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය

65/9 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත කොළඹ 02. ශ්‍රී ලංකා
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02.
Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka
Tel : + 94 112 433131 /+94 112 433512
FAX : + 94 112 433131
E -mail : slsaheadq@gmail.com
web : www.scout.lk